Business Studies Business Studies Business Studies
Business Studies Business Studies Business Studies

ද මැසනොද් විදුහල, කඳාන
De Mazenod College, Kandana

Business Studies Business Studies Business Studies
Business Studies Business Studies Business Studies

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
# General Certificate of Education (Advanced Level) Examination

| | | |
|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය<br>Business Studies | 12 ශ්‍රේණිය<br>Grade 12 | කාලය<br>පැය තුනයි |

උපදෙස් : එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## 1 කොටස

**(01)** "මානව අවශ්‍යතා හා උවමනා සපුරාලන ඕනෑම ආර්ථික කටයුත්තක් ව්‍යාපාරයකි."

I. ආයෝජකයින්ට ලාභ උපයා දීමට අමතරව ව්‍යාපාර වලින් වෙනත් ඇල්මැති පාර්ශවයන්ට ලැබෙන ප්‍රතිලාභ කවරේ ද? (ලකුණු 4)

II. ඉහත නිර්වචනය තුලට ලාභ උපයන ව්‍යාපාර මෙන්ම ලාභ නොලැබෙන ව්‍යාපාර ද ඇතුලත් වේ. මින් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 4)

III. (අ) ව්‍යාපාර විකාශනය අද දක්වා සිදුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 2)
(ආ) තෘතීය නිෂ්පාදනයට වැඩි ආයකත්වයක් ලබා දී ඇත්තේ මන් ද? (ලකුණු 2)

IV. "ව්‍යාපාරය සමාජයට ආපසු දෙන දෑ" මෙම නිර්වචනය ඉදිරිපත් කර ඇත්තේ කුමන රටේ ද? ඉන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 4)

V. (අ) ව්‍යාපාර ආචාර ධර්ම යනු කුමක් ද? (ලකුණු 2)
(ආ) "අන් අයට හානි නොකිරීම" "සත්‍ය දෑ නිෂ්පාදනය කිරීම" යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 2)

**(02)** ව්‍යාපාර පරිසරය අභ්‍යන්තර හා බාහිර පරිසරය වශයෙන් දෙවර්ගයකට බෙදිය හැකිය. බාහිර පරිසරය ආසන්න පරිසරය හා සාර්ව පරිසරය යනුවෙන් දෙවර්ගයකට බෙදිය හැකිය.

I. (අ) අභ්‍යන්තර, ආසන්න, සාර්ව පරිසර වලට අයත් වන දෑ දක්වන්න. (ලකුණු 2)
(ආ) මේවාට "SWOT" බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 2)

II. පහත සඳහන් බදු වර්ග නම් කරන්න.

- අනුක්‍රමික බදු
- ප්‍රතික්‍රමික බදු
- සමානුපාතික බදු
- සෘජු බදු හා වක්‍ර බදු

(ලකුණු 4 )

III. (අ) නිෂ්පාදිතයක ගුණත්වය සහතික කිරීමට උදව්වන නිෂ්පාදන හා පරීක්ෂා කිරීමේ පරිචයක් සඳහා වූ ලංකා ප්‍රමිති ආයතනය පිරිනමන සහතිකය කුමක් ද? (ලකුණු 1)
(ආ) ශ්‍රී ලංකා ප්‍රමිති ලංජන ක්‍රමයෙන් නිෂ්පාදකයාට හා පාරිභෝගිකයාට අත් වන වාසි වෙන වෙනම ලියන්න (ලකුණු 3)

IV. (අ) හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් වඩාත් ප්‍රබල වන්නේ හවුල් ආඥා පණත ද නැතහොත් හවුල් ඔප්පුව ද? (ලකුණු 1)

(ලකුණු 2)

(ආ) හවුල් ඔප්පුවක ඇති වැදගත් කම පැහැදිලි කරන්න. (ලකුණු 1)

(ඇ) හවුල් ගිවිසුම හා හවුල් ඔප්පුව අතර ඇති වෙනස කුමක් ද?

(ලකුණු 4)

V. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියට අයත් කාර්යයන් මොනවා ද?

(ලකුණු 1)

(03) I. (අ) රක්ෂණය හා ආරක්ෂණය යනු කුමක් ද?

(ආ) පැහැදිලි කරන්න. (ලකුණු 1)

A. නිෂ්පාදකයින්ගේ වගකීම් රක්ෂණය (ලකුණු 1)

B. මහජන වගකීම් රක්ෂණය (ලකුණු 1)

(ඇ) රක්ෂණයෙන් ව්‍යාපාරයට ලැබෙන ප්‍රතිලාභ මොනවා ද?

(ලකුණු 2)

II. (අ) වෙළඳ සැල් රහිත සිල්ලර වෙළඳාම යනු කුමක් ද?

(ආ) නොනිදන ව්‍යාපාර වලින් භාණ්ඩ හා සේවා මිලට ගැනීමෙන් ලැබෙන ප්‍රතිලාභ මොනවා ද? (ලකුණු 2)

(ලකුණු 1)

III. (අ) වරලත් ව්‍යාපාර යනු මොනවා ද? (ලකුණු 2)

(ආ) වරලත් ව්‍යාපාර වර්ග නම් කරන්න ? (ලකුණු 1)

(ඇ) මේ මගින් වරලත් හිමියාට ලැබෙන ප්‍රතිලාභ මොනවා ද?

(ලකුණු 3)

IV. (අ) සම්මුති සහතිකයේ අඩංගු විය යුතු කරුණු මොනවා ද? (ලකුණු 1)

(ආ) සම්මුති සහතිකය යනු කුමක් ද?

(ලකුණු 1)

V. (අ) ජනසන්නිවේදනය යනු කුමක් ද? (ලකුණු 3)

(ආ) ලිඛිත හා වාචික සන්නිවේදන ක්‍රම වලින් ඇති වාසි හා අවාසි මොනවා ද?

(04) I. "ව්‍යවසායකයා ව්‍යාපාරය තුල නොව ව්‍යාපාරය මත ( An entrepreneur should work on the business not in it) කටයුතු කල යුතුය"

(ලකුණු 4)

මෙම ප්‍රකාශනයෙන් ගම්‍ය වන අදහස සාකච්ඡා කරන්න.

II. පහත සඳහන් වන්නේ ව්‍යවසායකයින් තුල පවත්නා පෞරුෂත්ව ගති ලක්ෂණ කිහිපයකි.

A. අභිලාෂය (Ambitions)
B. ස්වාධීන බව (Independent)
C. ධෛර්යය සම්පන්න බව ( Passionate)
D. ආත්ම විශ්වාසය ( Self - confident)
E. දැක්මක් සහිත බව ( Visionary)
F. සුභවාදී බව ( Optimistic )
G. පුද්ගල අභිමුඛ බව (People Oriented)

මේවා අතුරින් ඕනෑම හතරක් (4) ක් තෝරා ගෙන ඒවායේ අර්ථය පැහැදිලි කරන්න. (ලකුණු 4)

**III.** ගනුදෙනු සඳහා විද්‍යුත් මුදල් (e - money) භාවිතා කිරීමේ සීඝ්‍ර වර්ධනයක් වර්තමානයේ දැකිය හැකිය. ගනුදෙනු සඳහා භාවිතා වන විද්‍යුත් මුදල් නම් කරමින් මේවා ජනප්‍රිය වීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 4)

**IV.** (අ) බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු අතර සැසඳීමක් කරන්න.
(ආ) කල්බදු සමාගම් වලින් ව්‍යාපාරිකයින්ට ලබා ගත හැකි සේවාවන් සඳහන් කරන්න. (ලකුණු 4)

**V.** (අ) චෙක්පතක් රේඛනය කිරීමෙන් අණකරු අපේක්ෂා කරන්නේ කුමක් ද?
(ආ) චෙක්පතක් පිටසන් කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? එහි අරමුණ ද පැහැදිලි කරන්න. (ලකුණු 4)

**(05) I.** (අ) චෙක් පතකට සාමාන්‍ය රේඛනය යෙදීමට වඩා විශේෂ රේඛනය යෙදීමෙන් ලැබෙන ප්‍රතිඵල කවරේ ද? (ලකුණු 2)
(ආ) ධාරක චෙක් පත හා විධාන චෙක් පත අතර කෙබඳු වෙනසක් ඔබ දකින්නේ ද? (ලකුණු 2)

**II.** වර්තමානයේ විද්‍යුත් බැංකුකරණයේ (e- Banking) සීඝ්‍ර ව්‍යාප්තියක් දැකිය හැකිය. විද්‍යුත් බැංකුකරණය යටතට ගැනෙන ප්‍රධාන බැංකු කටයුතු දෙකක් නම් කර ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 4)

**III.** අවදානම් ආවරණය කිරීමක් රක්ෂණයෙන් සිදු වේ. එසේ නම් ව්‍යාපාරිකයෙකුට ඕනෑම අවදානමක් රක්ෂණය කල හැකි ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 4)

**IV.** වර්තමානයේ ඉලෙක්ට්‍රෝනික් හා ඩිජිටල් තාක්ෂණය යටතේ බහුලව යොදා ගන්නා සන්නිවේදන ක්‍රම තුනක් නම් කර කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 4)

**V.** (අ) වෙළඳ කලාපයක් යනුවෙන් කුමක් අදහස් කෙරේ ද?
(ආ) ලෝකයේ දැනට ක්‍රියාත්මක ව පවතින වෙළඳ කලාප දෙකක් නම් කරන්න.
(ඇ) වෙළඳ කලාප තුළින් සාමාජික රටවලට අත්වන ප්‍රතිලාභ දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)

**(06) I.** (අ) "අවශ්‍යතා" හා "වුවමනා" වෙන් වෙන් වශයෙන් අර්ථ දක්වන්න.
(ආ) අවශ්‍යතා හා වුවමනා අතර පවත්නා සමානතා හා අසමානතා නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 4)

**II.** ව්‍යාපාර පරිසරය මූලික වශයෙන් අභ්‍යන්තර පරිසරය හා බාහිර පරිසරය (සාර්ව) වශයෙන් වර්ග කෙරේ. ව්‍යාපාර ආයතනයක අභ්‍යන්තර පරිසරයෙහි පැන නැගිය හැකි ශක්තීන් හා දුර්වලතා වලටත් බාහිර පරිසරයෙහි පැන නැගිය හැකි අවස්ථා හා තර්ජන වලටත් නිදසුන් දක්වන්න. (ලකුණු 4)

**III.** (අ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පාලනය වන්නේ කවර අමාත්‍යාංශයක් යටතේ ද?
(ආ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ මූලික කාර්යයන් කවරේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

**IV.** (අ) 2007 අංක 07 දරණ සමාගම් පණත අනුව සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා අදළ අයදුම් පත සමඟ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කල යුතු ලියවිලි 4ක් නම් කරන්න. (ලකුණු 2)
(ආ) එම ලියවිලි අතුරින් ප්‍රධාන ලියවිල්ල නම් කර, එහි ඇතුලත් ප්‍රධාන කරුණු සඳහන් කරන්න. (ලකුණු 2)

V. ලොකුබංඩා සිල්ලර වෙළඳ සැලක හිමිකරුවෙකි. දිගු කලක සිට ඔහු මෙම ව්‍යාපාරයේ යෙදී සිටිය ද කිසි දිනෙක බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන ගොස් නොමැත. එබැවින් බැංකු ගණුදෙනු පිළිබඳව ඔහුට කිසිඳු අත්දැකීමක් හෝ දැනුමක් නොමැත. ඔහු ව්‍යාපාර මුදල් ලඟ තබා ගැනීමටත් සැමවිට ම මුදලින් ගණුදෙනු කිරීමටත් ප්‍රිය කරයි. වාණිජ බැංකුවක ජංගම ගිණුමක් මගින් ගණුදෙනු කිරීමෙන් ලැබිය හැකි ප්‍රතිලාභ පිළිබඳව ලොකුබංඩාට ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද? (ලකුණු 4)

(07) I. (අ) රජයක ආර්ථික අරමුණු 4 ක් නම් කරන්න.

(ආ) එම අරමුණු ඉටු කර ගැනීමට ව්‍යාපාර වලට දායක විය හැකි ආකාර 4 ක් සඳහන් කරන්න. (ලකුණු 4)

II. (අ) රජයට ආදායම් ලැබෙන ප්‍රධාන මාර්ග ලෙස සෘජු හා වක්‍ර බදු දැක්විය හැකිය. සෘජු බදු හා වක්‍ර බදු නිදසුන් සහිතව වෙන වෙනම පැහැදිලි කරන්න.

(ආ) "GMP සහතිකකරණය" හඳුන්වන්න.

(ඇ) දේශීය වශයෙන් නිපදවනු ලබන යම් යම් ආහාර නිෂ්පාදන වෙළඳ පොළට ඉදිරිපත් කිරීම සඳහා SLS ප්‍රමිතිය අනිවාර්යය වේ. එවැනි ආහාර නිෂ්පාදිත දෙකක් නම් කරන්න. (ලකුණු 9)

III. අමල්, බිමල්, හා චමල් හවුල් ව්‍යාපාරයක් පවත්වා ගෙන යති. පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ඔවුන් අතර මතභේදයක් පැන නැගී ඇත.

1. ලාභ බෙදා ගැනීමේ අනුපාතය
2. යෙදූ ප්‍රාග්ධනයට පොළී ලබා ගැනීම
3. සක්‍රිය හවුල්කරුවන් වන බිමල්ට හා චමල්ට වැටුප් ලබා ගැනීම
4. අමල් සපයා ඇති ණය මුදලට පොළී ලබා ගැනීමට ඉල්ලුම් කිරීම

හවුල්කරුවන් අතර පවතින ගිවිසුමේ මේ කරුණු සම්බන්ධයෙන් කිසිවක් සඳහන් නොවේ. 1890 හවුල් ව්‍යාපාර ආඥා පණත අනුව මෙම අවස්ථාවේ හවුල්කරුවන් කටයුතු කළයුතු ආකාරය වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න. (ලකුණු 7)

(08) I. (අ) ව්‍යවසායකයා, ව්‍යවසායකත්වය හා ව්‍යාපාර අතර පවත්නා සම්බන්ධතාවය කුමක් දැයි පැහැදිලි කරන්න.

(ආ) ව්‍යවසායකයින් බිහි වීමට පසුබිම් වන සාධක හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 4)

II. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා 2012 රාජ්‍ය අයවැය ලේඛණය මගින් යෝජිත ක්‍රියාමාර්ග පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 4)

III. (අ) පොදු පිළිගැනීම හොඳ මුදලක ගුණාංගයකි. ගණුදෙනුවේදී පොදු පිළිගැනීමක් ඇති වීමට නම් මුදල් තවත් ගුණාංග කිහිපයකින් යුක්ත විය යුතුය. එවැනි ගුණාංග හතරක් සඳහන් කරන්න.

(ආ) පහත දක්වෙන මුදල් වර්ග පැහැදිලි කරන්න.

1. ණය මුදල්
2. ව්‍යවහාර මුදල් (නියෝග මුදල්) (ලකුණු 4)

IV. ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ නියමුවා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු නම් කර එම අරමුණු සාක්ෂාත් කරගන්නේ කෙසේදයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

V. වර්තමානයේ බොහොමයක් බැංකු සේවා විද්‍යුත් ආකාරයෙන් සිදුවේ. විද්‍යුත් බැංකුකරණය යටතේ සිදුවන සේවාවන් හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 4)